සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

දෙවන වාර විභාගය - 2018
Second Term Evaluation

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 7 | විෂයය / பாடம் / Subject: Christianity | පත්‍රය / வினாத்தாள் / Paper: I/II | පැය / மணித்தியாலம் / Hours: 02 |

සැලකිය යුතුයි :- සියලුම ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න

I කොටස

01. ස්නාවක ජොහාන් තුමා විශේෂ මෙහෙයකට කැප කළ කෙනෙක් බව ගාබ්‍රියෙල් දේව දූතයා ප්‍රකාශ කළේ,
i. මරියතුමියට ය ii. එළිසෙබත්ට ය iii. සෙකරියස්ට ය iv. ජොහාන්ට ය

02. ජේසුස් වහන්සේ දරුවන්ගේ ජීවිතවල දුටු දෙයක් වන්නේ,
i. කිපෙන සුළුභාවය තිබෙන බවය ii. දරුදඬුභාවය තිබෙන බවය
iii. නපුරුභාවය තිබෙන බවය iv. වටිනාකමක් තිබෙන බවය

03. ස්නාවක ජොහාන්ගේ පළමු දේශනය සිදු කරන ලද්දේ,
i. ජුදයේ නාසරෙත් ප්‍රදේශයේ ය ii. ගලීලයේ බෙත්ලෙහෙම් ප්‍රදේශයේ ය
iii. ජුදයේ පාළුකර ප්‍රදේශයේ ය iv. ජුදයේ රතු මුහුද අසල ප්‍රදේශයේ ය

04. දෙවිඳුන්ගේ ස්ථිර ප්‍රේමය තුළ ලැබෙන වරප්‍රසාදයකි
i. පාපයෙන් මිදි පූර්ණ ජීවිතයක් ගත කිරීම
ii. දේව ගරුබිය නොමැති ජීවිතයක් ගත කිරීම
iii. දයාවෙන් තොර ජීවිතයක් ගත කිරීම
iv. අසාධාරණය රජයන ජීවිතයක් ගත කිරීම

05. මිනිසා විසින් දේව මැවිල්ල විනාශ කරන අවස්ථාවක් නොවන්නේ,
i. අපවිත්‍ර ජලය පිරිසිදු ගංගාවලට මුදා හැරීම
ii. කර්මාන්ත ශාලා වලින් කළුදුම් මුදා හැරීම
iii. පොලිතින්, ප්ලාස්ටික් භාවිතයෙන් අත් හැරීම
iv. පරිසරයට ආවේනික ගහ කොළ කපා හැරීම

06. ''නුඹේ දෙවිවන සමිඳානන් වහන්සේ පරීක්ෂා නොකරන්න.''මෙය සඳහන් වන පරණ ගිවිසුමේ පොත වන්නේ,
i. උත්පත්ති ii. ගීතාවලිය iii.ජෙරමියා iv. ද්විතීය නීති සංග්‍රහය

07. ''මැරෙන තරමට මගේ සිත අතිශයින් ශෝකාන්විතය'' මෙය ජේසුස් වහන්සේ පවසන ලද්දේ,
i. ගෝලයන් 12 දෙනාට ය ii. පේදුරු හා සෙබදිගේ පුත්‍රයන් දෙදෙනාට ය
iii. මතෙව් හා තෝමස් දෙදෙනාට ය iv. පේදුරු හා ජාකොබ් දෙදෙනාට ය

08. ශුද්ධාත්මා බලය කරණකොට ගෙන ශ්‍රවකයින් කළ ක්‍රියාවකි,
i. අන් අය ගැන නොතකා කටයුතු කිරීම ii. භයව දොර වසා යාච්ඤාවෙන් කථා කිරීම
iii. අරමුණක් නොමැති ව සාක්ෂි ගැන කථා කිරීම iv. ධෛර්යෙන් බලයෙන් සාක්ෂිකාර ජීවිත ගත කිරීම

09. සුදර්ශන දොරටුව අසල ලබන ලද කොර වූ මිනිසා එම රෝගයෙන් කොපමණ කාලයක් පීඩා වින්දේද?
i. උපන්දා පටන් ii. වසර තිහක් පමණ
iii. වසරක් පමණ iv. වසර දහයක්

10. මුල් සභාවෙන් අපගේ ජීවිතයට ගත හැකි ආදර්ශයක් වන්නේ,
i. කිතුණු ආගම තනිව අදහන ආගමක් වීම ii. පුරුද්දක් ලෙස නමස්කාරය ට සහභාගී වීම
iii. දේව චාරිත්‍ර වලට මුල් තැන දීමට උනන්දු වීම iv. සභාවක් ලෙස එකමුතුව කැපවීමෙන් සහභාගී වීම

11. ''මෙහි තේරුම කිමෙක්ද?'' මෙය කවුරුන් කා හට පවසන ලද්දක්ද?
i. පෙන්නකොස්ත දින පේදුරු විසින් ගෝලයෝ දස දෙනාටය
ii. පෙන්නකොස්ත දින පැමිණි අය ඔවුනොවුන් අතර ය
iii. පෙන්නකොස්ත දින ජුදෙව්වරු විසින් අන්‍යජාතිකයන්ට ය
iv. පෙන්නකොස්ත දින ජොහාන් විසින් පේදුරුටය

12. ජේසුස් වහන්සේ අවසාන රාත්‍රි භෝජනයෙන් පසු නික්ම ගියේ,
i. ශ්‍රාවකයින්ගේ පාද සේදීමටය ii. ජුදෙව් මන්ත්‍රණ සභාවටය
iii. ඔලිව් කන්දටය iv. පාස්කු මංගල්‍යයට ය

13. අන් අය ඔබට සැලකීමට නම් ඔබ අන් අයට නොකල යුතු දෙයකි,
i.එක සමානව සැලකීම ii. ආදරයෙන් සැලකීම
iii. වංකව සැලකීම iv. ගෞරවයෙන් සැලකීම

14. ස්නාවක ජොහාන් බව්තීස්මය සඳහා පැමිණි ජනතාවට දුන් වැදගත් ම උපදේශනය,
i.හොඳින් පිරිසිදු වී පැමිණෙන ලෙසය ii. ජේසුස් වහන්සේ හමු වී පැමිණෙන ලෙසය
iii. පසු තැවි සිත් හරවා ගෙන පැමිණෙන ලෙසය iv. ස්වර්ග රාජ්‍ය ළඟ නිසා පැමිණෙණ ලෙසය

15. දෙවියන් වහන්සේ පොළොවේ වෙසෙන සියලු වන සතුන්ට ද ආකාශ පක්ෂීන්ට ද උරගයින්ට ද කුමක් දෙන බව පැවසුවේද?
i. ජීවනය දෙන බවය ii. වාසස්ථාන දෙන බවය
iii. ආහාර පාන දෙන බවය iv. කමාව දෙන බවය

16. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ම තමන්ට හිරි හැර කල අයට,
i. අපහාස කළ සේක ii. ශාප කළ සේක iii. අනුකම්පා කළ සේක iv. පීඩා කළ සේක

17. ජේසුස් වහන්සේ '' කුමක් කමු ද, කුමක් බොමු ද කියා ජීවිතය ගැනවත් කරදර නොවන්න'' යැයි පවසමින් දේව රැකවරණය පෙන්වීමට උදාහරණ සේ ගත්තේ,
i. වන සතුන්ව ය ii. මසුන්ව ය iii. කුරුල්ලන්ව ය iv. මිනිසුන්ව ය

18. ''ලුණු විෂ බීජ නාශකයක් ලෙස'' ක්‍රියාකරන්නා සේ අප සමාජය තුළ කෙසේ ක්‍රියා යුතුද?
i. සමාජයේ අයහපතට වැරදිවලට එරෙහිව ක්‍රියා කිරීම ii. සමාජයේ තමා ගැනම සිතා ක්‍රියා කිරීම
iii. සමාජයේ වරදට ඇද දමන කාරණා තුළ ක්‍රියා කිරීම iv. සමාජයේ කුණු විස බීජ එකතු කිරීමට ක්‍රියා කිරීම

19. ''යක්ෂයා මෙකි පරීක්ෂා නිමවා ---------අවස්ථාවක් එනතුරු උන්වහන්සේ අතහැර ගියේය.'' මෙම බයිබල් පාඨයේ හිස්තැනට යෙදෙන වචනය වන්නේ,
i. යලිත් ii. සුදුසු iii. පාපී iv. දිනක

20. ''සියල්ල නිම විය'' යන කුරුසියේ හය වන වදනින් සවිමත් වන කිතුනුවා
i. හැම කාර්යයක්ම දේව දෑතට භාරදීම
ii. දෙවිඳුන්ට සියල්ලේ දී මැසිවිලි නැගීම
iii. ඉටු කිරීමට ඇති කාර්යයන් අතහැර දැමීම
iv. හිතවතුන්ට පමණක් උපකාර කිරීම

(ල. 2x20=40)

## II කොටස

පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ. ඉතිරි ප්‍රශ්න අතරින් ප්‍රශ්න හතරකට (04)කට පිළිතුරු සපයන්න

01.) i. 'මම උන්වහන්සේගේ පාවහන්වල පටිය මුදන්නට වත් නොවටිමි''යි කියා පැවසීමෙන් ස්නාවක ජොහාන් තුමාගේ කැපී පෙනෙන ගුණාංගය දක්වන්න.

ii. ''වලාකුළු වලින් වැස්ස මවා සව්සත වෙත එවන්නේ එතුමාණෝය'' මෙම බයිබල් පදය සඳහන් වන්නේ බයිබලයේ කුමන පොතේද?

iii. දේව ප්‍රේමය තුළ අපට වැරදි කරන අයට අප කුමක් කල යුතුද?

iv. නෝවාගේ කාලයේ මිනිස් සමාජය දූෂණය වීමේ ප්‍රතිඵලයක් ලෙස සිදු වූයේ කුමක්ද?

v. ''ස්වාමිනි, මාගේ පාද පමණක් නොව අත් ද, හිස ද, සේදුව මැනව, මෙය පැවසුවේ කව්ද?

vi. ශුද්ධාත්මයාණන් වහන්සේ ආගමනය වන අවස්ථාවේ සිටිය අලුතින් ශ්‍රාවකයෙකු ලෙස තෝරාගත් තැනැත්තා කව්ද?

vii. ''රන්වත්------------මට නැත. එහෙත් මට ඇති දේ ඔබට දෙමි. ----------------ජේසුස් වහන්සේගේ නාමයෙන් ඇවිදින්න'' මෙම බයිබල් පදය ලියා හිස් තැන පුරවන්න.

viii. ජුදෙව් සමාජයේ දේව මාලිගයට හෝ ධර්ම ශාලාව නොලත් ජන කොටස් දෙකක් ලියන්න.

ix. ජේසුස් වහන්සේ කුරුසියේ දී පැවසු තුන් වන වචනය තුළින් අප දෙමාපියන් රැකබලා ගැනීමේදි පැවරෙන වගකීම් දෙකක් ලියන්න

x. ජේසුස් වහන්සේ පාළුකරයේ නිරාහාරව යාච්ඤාවෙන් සිටි දින ගණන කීයද?

(ලකුණු 2x10=20)

02.) i. දෙව්පියාණන් වහන්සේ මිනිසා නිර්මාණය කල ආකාරය කෙබඳු ද? (ල. 2)

ii. ඒදන් උයන රැක බලා ගැනීම යනුවෙන් දෙවි සමිදාණන්වහන්සේ මිනිසාට පැවරූ වගකීම් දෙකක් දක්වන්න. (ල.3)

iii. අහසේ කුරුල්ලන්-------------------උන් වපුරන්නේවත් කපන්නේවත් අටු කොටුවල රැස් කරන්නේවත් නැත. ඔබ ඔවුනට වඩා බොහෝ වටිනවා නොවේද? මෙම බයිබල් පදයෙන් උගත හැකි පාඩම් 5ක් දක්වන්න. (ල.5)

03.) i. ජේසුස්වහන්සේ සමග ගෙත්සෙමනේ උයනට ගිය ශ්‍රාවකයින් දෙදෙනෙකු නම් කරන්න. (ල.2)

ii. අවසාන රාත්‍රි භෝජනයේදී ජේසුස් වහන්සේ රොටි ගෙන සිදු කළ ක්‍රියාව හා පැවසු වදන් දක්වන්න. (ල.3)

iii. ''ලෝකයේ ආලෝකය ලෙස'' අප ජීවත් වන ගම තුළ අපට කළ හැකි සේවා තුනක් විස්තර කරන්න. (ල.5)

04.) i. 'ගින්න' මඟින් දේව වැඩ සිටීම පෙන්නුම් කරන බයිබලයේ සඳහන් අවස්ථා දෙකක් දක්වන්න.(ල.2)

ii. මුල් කිතුනු සභාවේ පොදුවේ පැවති ලක්ෂණ තුනක් දක්වන්න. (ල.3)

iii. උත්ථාන වූ ජේසුස් වහන්සේ සමඟ සම්බන්ධ වීමට අපට කල හැකි ක්‍රියාවන් තුනක් විස්තර කරන්න. (ල.5)

05.) i. සැකය හා බලාපොරොත්තුව නැතිව ජේසුස් වහන්සේගේ නැවත නැගිටීම අවිශ්වාස කළ ශ්‍රාවකයෙකු දක්වන්න (ල.2)

ii. අප '' උන්වහන්සේ නොදුටු නමුත් ඇදහු බැවින් ---------- වේ යැයි එතුමා පැවසීය. හිස් තැනට සුදුසු වචනය කුමක්ද? (ල.3)

iii. කිතුනු ඔබට සතුරුකම් කරන අය උදෙසා ඔබ සැලකිය යුතු ආකාර තුනක් විස්තර කරන්න. (ල.5)

06.) i. ''සමිඳුන්ට මාවත පිළියෙල කරන්න'' මෙය පැවසූ දිවැසිවරයා කවුද? (ල.2)

ii. 'ස්නාවක ජොහාන් තුමා' පැවසූ පරිදි ජේසුස් වහන්සේ ලබා දෙන බව්තීස්මයට අයත්වන්නේ කුමක්ද? (ල.3)

iii. තමාගේ පව් ගැන පසුතැවිලි වෙමින් මනස්ථාපනයේ යාච්ඤාවක් ලියන්න. (ල. 5)

07.) i. පහත දැක්වෙන මාතෘකා අතරින් දෙකක් තෝරා කෙටි සටහන් ලියන්න.

1. ජේසුස් වහන්සේට පාළුකරයේදී පැමිණි දෙවන පරීක්ෂාව
2. දේව ගරු බිය ඇති ජීවිතයක් ගත කරමු
3. දේව මැවිල්ලේ අඛණ්ඩ ක්‍රියා කරයි
4. ජේසුස් වහන්සේ කුරුසියේදී පැවසූ පළමු වන වදන අද අපට වැදගත් වේ. (ලකුණු 2x5=10)